# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 19 දරන
# මහ නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1987 අප්‍රේල් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 19 දරන මහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින.]

එල්. ඩී.—ඕ. 14/86

මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1987 අංක 19 දරන මහ නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ නගර සභා ආඥාපනතේ 40 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 252 වන අධිකාරයේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ උපවගන්තියේ (ඹ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඹඹ) මහ නගර සභා ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක සීමා ඇතුළත ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සංස්ථාපිත සංවර්ධන සභාව විසින් ඒ මහ නගර සභාව වෙත පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම ; තවද, ඒ සංවර්ධන සභාව විසින් ක්‍රියාවේ යෙදීම සඳහා මහ නගර සභාව වෙත භාරකරන ලද යම් වැඩක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාවේ යෙදීම ; " ;

(ආ) ඒ උපවගන්තියේ (ඬ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

" (ඬඬ) මහ නගර සභා ප්‍රදේශයේ වාසය කරන්නන් සඳහා සේවා නියුක්ති වැඩ සටහන් සංවිධානය කිරීම ;

(ඬඬඬ) (i) මහ නගර සභා ප්‍රදේශය ඇතුළත ගොඩනැඟිලි, ශෘහ භාණ්ඩ, ක්‍රීඩා භූමි, නේවාසිකාගාර, ගුරු නිල නිවාස, ක්‍රීඩා උපකරණ සහ පුස්තකාල පහසුකම් වැනි අධ්‍යාපන පහසුකම් සැපයීම සඳහා වූ වැඩ සටහනක් පිළියෙල කර, උචිත බලධරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ii) මහ නගර සභා ප්‍රදේශය ඇතුළත වූ පාසල් විවෘත කිරීම, වසා දැමීම, ඒකාබද්ධ කිරීම, නම් කිරීම සහ උසස් කිරීම සම්බන්ධයෙන් උචිත බලධරයාට නිර්දේශ කිරීම ; ".

ඒ 094630—7,335 (86/12)

ප්‍රධාන ප්‍රඥප්තියේ 188 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 188 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

“ (ඒ) මාතෘ සහ දාරකාභිවෘද්ධි සේවා ඇති කිරීම සහ පවත්වාගෙන යාම, සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම, මූලික සෞඛ්‍ය ආරක්ෂක මධ්‍යස්ථාන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති පවත්වාගෙන යාම, සභාව විසින් පිහිටුවන ලද යම් මාතෘ සේවයක කාර්ය සඳහා වින්නඹු මාතාවන් පුහුණු කිරීම, සහ වැස්සෙන්, ජල ගැලීම්වලින්, ගින්නෙන්, භූමිකම්පා වලින්, සුළි සුළඟින්, සාගතවලින් හෝ වසංගත වලින් ඇති වූ ආපදාවන්ට සහන සැලසීම සඳහා වූ පුණ්‍යාධාර හෝ පියවර විෂයෙහිලා සභාව විසින් දරන ලද සියලු වියදම් ; ” ;

(ආ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

“ (ඒඒ) ආගමික චාරිත්‍රවිධි සහ උත්සව සංවිධානය කිරීම, දහම් පාසල් සහ ශාසන ආරක්ෂක මණ්ඩල පවත්වාගෙන යාම, සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, සාහිත්‍ය සහ සංස්කෘතික උත්සව සංවිධානය කිරීම, සාහිත්‍ය සහ සංස්කෘතික වටිනාකමින් යුත් පොත් ප්‍රකාශනය කිරීම සහ කලාකරුවන්ට, ග්‍රන්ථ කර්තෘවරුන්ට සහ ශිල්පීන්ට ත්‍යාග ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වියදම් සඳහා වූ ආධාර මුදල් ඇතුළු ව ආගම සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා සභාව විසින් සම්මත කරන ලද සියලු ආධාර මුදල් ; ” ; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයෙහි “ දිළින්දන්ට සහනය සඳහා ” යන වචන වෙනුවට, “ දිළින්දන්ට සහනය සඳහා, අනාථ තැනැත්තන් හෝ ශාරීරික, මානසික හෝ සාමාජික වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ රැකවරණය සඳහා ” යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 272 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 272 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (11) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(11) ගවයින් සඳහා නිරෝධායන ස්ථාන පවත්වාගෙන යාම සහ විධිමත් කිරීම, එකී රඳවා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම ගව ආදී සතුන් සහ බල්ලන් එන්නත් කිරීම සහ ප්‍රතිශක්තිකරණය සඳහා පහසුකම් සැපයීම" ;

(ආ) ඒ වගන්තියේ (29) වන ඡේදයෙහි "තහනම් කිරීම" යන වචන වෙනුවට "තහනම් කිරීම සහ වෙරළබඩ මසුන් ඇල්ලීමට ඇති බාධක ඉවත් කිරීම." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ වගන්තියේ (30අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(30ආ) කර්මාන්ත අපද්‍රව්‍ය විධිමත් කිරීම සහ පාලනය කිරීම.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දට ප්‍රථම දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.